# තනතුරු ඇබෑර්තු
## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල)
## රෙජිස්ට්‍රාර් තනතුරු පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතුය.
02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.
03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය.
04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරී ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.
05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයකු සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.
06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

    සැ.යු. - අ.පො.ස. (සා.පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතුය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතුය.

    මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.
07. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතුය.
08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.
09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම් වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.
10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූනි මස 08 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය.

එස්. ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

එස්. ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්
2026.........04.......... මස .........09......... දින.
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදිය

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාශය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | පුත්තලම | පුත්තලම් කඩවත්සතර කොට්ඨාශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (සිංහල භාෂා) | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , පුත්තලම |